
# උඩ අහසේ චාරිකාව



ජයලි තරුල්යා චන්ද්‍රසිරි

# උඩ අහසේ චාරිකාව

ජයලි තරුල්යා චන්ද්‍රසිරි

## කතෘගේ වෙනත් කෘති

- අහංකාර සරුංගලය
- දඟකාර හා පූංචා
- ආදරණීය පූස් පැටියා

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය

5-A ශ්‍රේණිය

2025/02/08

ISBN 978-624-208-799-3

# පිදුම

පොත පතෙහි අරුත පෙන්වා දෙමින් ග්‍රන්ථ කරණයට මා යොමු කළ සමන්මලී ගුරු මැණියන්ටත් , අමිතා ගුරු මැණියන්ටත් , පළමු ශ්‍රේණියේ දී මා හට අකුරු කියාදෙමින් ගුණ ගරුක දියණියක් වන්නට ඔවදන් දුන් ගයනි ගුරු මැණියන්ටත් , අම්මාටත් තාත්තාටත් මෙම ග්‍රන්ථයේ මෙන්ම සැමවිටම හරි වැරදි කියා දෙන පුංචා ටත් සෙනෙහසින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# උඩ අහසේ චාරිකාව

චතුර පුංචි ළමයෙක් , එයාට අවුරුදු හතයි. චතුර හරිම ආසයි වලාකුළු අතරින් තරු පැන්චෝ පසුකරමින් යන ගුවන් යානය පදවන නියමුවෙක් වෙන්න. චතුර හැමදාම රෑට එලියට ගොස් තරු පැන්චෝ දිහා බල බලා හිනාවෙනවා. හඳ මාමාගෙන් කිරියි පැණියි ඉල්ලනවා. ඒක එයාගේ විනොදාංශයක්. ඉතින් උඩ ඉන්න හඳ මාමාට හැමදාම මේ සද්දේ ඇහෙනවා ඉතින් හඳ මාමා පුංචි චතුර රෑ නින්දට ගියාට පස්සේ හිමින් සීරුවේ ඇවිත් දොර ළඟින් කිරියි පැණියි තියලා ගියා. ඊළඟ දවසේ උදේ චතුර අහරලම් වතුර වීදුරුවක් බිලා දොර ඇරලා බලනකොට කිරියි පැණියි දොරළඟ තියනවා  දැක්කා . “කවුද මේ කිරියි පැණියි තියල ගිහින් තියෙන්නේ” ... ? චතුර කල්පනා කළා. චතුරට මතක් වුණා හැමදාම එයා හඳමාමාගෙන් කිරියි පැණියි ඉල්ලුවා නේද කියලා.



එදා චතුරගේ දහවල් අහාරයේ අතුරුපසට  රසම රස කිරිපැණිත් එකතු  උණා.

එදා රෑ චතුර හඳ මාමා දිහා ගොඩක් වෙලා බලාගෙන ස්තුති කළා . රෑ නින්දට ගියේ පුදුමාකාර ප්‍රබෝධයකින් එත් චතුර කොපමණ උත්සහකළත් නින්ද නම් චතුරගේ ඇස් ලඟටවත් ආවේ නෑ . හැමෝ්ටම හොරෙන් චතුර හිමින් සැරේ ආයෙත් හඳ මාමා බලන්න  ආවා .

“අනේ හඳ මාමේ මට ඔය උඩ අහසේ තියන අසිරිය පෙන්නන්නකො” සීතල පුළුන් වලාකුළු අතරින් දිදුලන තරුකැට දිහා බලමින් ගුවන් යානයක් වාගේ පියාබන්න මට ආසයි. මට තාත්තා කියල තියනවා ග්‍රහ ලෝකත් ගොඩක් ඈත අහසේ තියනවා කියලා තව එතකොට දෙවිවරු ඉන්න දිව්‍ය ලෝකත් ඔය පැත්තේ තියනවා කියල අපේ සීයා කියල තියනවා. මට ඒ හැම දෙයක්ම මගේ ඇස් වලින්ම බලන්න ආසයි .

නිමේෂයකුයි ගත උණේ නිල්පාට ලොකුම ලොකු එළියක් පහළට එනවා මට පෙනුණා. මගේ සිතට ලොකු බයක් මෙන්ම කුතුහලයක් දැනුණා. හිතට සවිය ගෙන මම තව තවත් ඇසිපිය නොහෙළා බලාගෙන හිටියා.

නිල් පාට එළියකින් බැබළෙන රන්වන් පාට පුංචි හඳ මාමා කෙනෙක් නේද, මගේ සිතත් දෙපාත් වේගයෙන් ගැහෙන්න ගත්තා ගේ ඇතුළට දුවන්න හැදුවා විතරයි

“ බයවෙන්න එපා චතුර පුතා අර ඈත අහසේ ඉන්න හඳ මාමා තමයි මාව එව්වේ ඔයා හැමදාම හඳ මාමා ට කතාකරනවා එයා අහගෙන හිටියේ, එයා පුංචි ළමයින්ට හරිම ආදරෙයි මට පරිස්සමින් ඔයා එකතුකරගෙන

අහසේ රවුමක් එක්කරගෙන ගිහින් පෙන්නන්න කිව්වා බය වෙන්න එපා පුතේ එන්න මාත් එක්ක යන්න”.



“අහස ගොඩාක් සීතලයි ඔයාලට හුස්ම ගන්නත් අමාරුයි ඒ නිසා මේ ඇඳුම ඇඳගෙන ඉක්මනට මගේ පිට උඩට නගින්නකෝ” “හොඳයි හඳ මාමේ” චතුර කිව්වා


හඳ මාමා ජෙට් එකකටත් වැඩි වේගයෙන් මාව උඩ අහසට අරගෙන ආවා

“චතුර පුතේ දැන් අපි ඉන්නේ ගොඩක් උඩ අහසේ . ඔයාට ගොඩක් ලස්සනට උඩ අහස පෙනුනට ඔයා හිතනවට වඩා මේවා ලඟට ආවම නම් මිනිස්සුන්ට හරිම අනතුරු දායකයි. පුතා අහල තියෙන ග්‍රහලෝක ටිකක් පෙන්නලා මම දැන් තොරතුරු ටිකක් කියලා දෙන්නම් පුතා කැමතියි නේද “?

“ඔව් හද මාමේ මම ගොඩක් ආසයි “

අර දුරින් පේන රතුපාට ගිනි බෝලයක් වගේ පෙන්නේ ඉර මාමා, එයා තමයි අපේ තාත්තා අපි ඔක්කොම අල්ලගෙන ඉන්න එයාට ලොකු බලයක් තියනවා ඒකට තමයි ගුරුත්වාකර්ෂණ බලය කියල කියන්නේ. දැන් මම පෙන්නන්නම්කො බුද ග්‍රහයා මෙයා ඉර මාමා ට ලඟින්ම ඉන්න නිසා හිරුට මුහුණලා තියෙන පැත්ත හැමවෙලේම ගොඩක් රස්නෙයි ලඟින්ම ඉන්නවා කිව්වට ඉර මාමාගේ ඉදන් සැතපුම් මිලියන 36 වගේ දුරයි.

දැන් මම යන්නේ ඔයාලගේ ලෝකෙට උදේ පාන්දරටයි සවස් කාලයටයි පෙනෙන සිකුරු ග්‍රහයා පෙන්නන්නයි.



“හරි හරි මට මතකයි,  අක්කා  මට පාන්දර අහසේ  අර ලොකුවට දීප්තියෙන් බැබළෙන්නේ  පහන් තරුව කියලා පෙන්නලා තියෙනවා. හවසට ඉරබටු තරුව කියලත් කියනවා හඳ මාමේ”.

ඔවු පුතේ මෙයාට ඉර මාමා වටේ යන්න ඔයාලගේ දින 262 ක් ගතවෙනවා.

දැන් මම පෙන්නන්නම්කො ඔයාලා ජීවත් වන ලෝකය. ගස්වැල්, කඳුවැටි, සාගර, ඇළ දොළ, කෙත්වතු, දියඇලි වලින් පිරුණු අපි හැමෝටම ඉන්න ලස්සනම ලස්සන දඟකාර නිල් ග්‍රහයා තමයි ඒ. ඉර තාත්තා වැඩියෙන්ම ආදරේ එයාට තමයි  අපි හැමෝම රෑ  අහසට ඇවිත් බැබළෙන්නේ   එයාව ලස්සන කරන්න තමයි. හැබැයි ඔයාලගේ සමහර නපුරු මිනිස්සු ඔයාලගේ ලෝකෙට කිසිම ආදරයක් නෑ . ඉර තාත්තා වෙලාවකට අඬ අඬා කියනවා කවදාහරි මේ අකාරුණික මිනිසුන් මගේ පුංචි පුතාව විනාශ කරලා දාවි  කියලා .

ඊළඟට අර ඈතින් රතුපාටින් බැබළෙන්නේ අඟහරු ග්‍රහයා මෙයා ඔයාලගේ ග්‍රහලෝකයට ගොඩක් දුරට සමානයි නමුත් ගස්වැල් , ජලය එහෙමනම් නෑ . ඒ නිසා ජීවින්ටනම් ඉන්න බැහැ.

දැන් මම පෙන්නන්නම් සෞරග්‍රහ මණ්ඩලයේ ලොකු අයියාව. පේනවා නේද එයා කොච්චර විශාලයිද කියලා , ඇත්තම තමයි හඳ මාමේ . එයා වටේට අර බැබළෙන්නේ හඳ මාමලා නේද ඔවු පුතේ එයාට අපේ හඳ මාමා වාගේ චන්ද්‍රයන් 67 ක් ඉන්නවා ඒ වගේම මෙයාට ඉර මාමා වටා යන්න දින 4331 ගත වෙනවා .

යමුකෝ පුතේ තව ටිකක් ඈතට ඉර මාමාගෙන් දුරට යන්න යන්න උෂ්ණුසුම අඩුවෙනවා වගේම කළුවරත් වැඩිවෙනවා හඳ මාමේ අර ලස්සන පාට පාට වළලු ගොඩක් මැද තියෙන ලොකුම ලොකු ලෝකය මොකක්ද ? ඒ තමයි පුතේ සෙනසුරු ග්‍රහයා, එයා දෙවෙනි වෙන්නේ බ්‍රහස්පති අයියට විතරයි.

"එතකොට හඳ මාමේ ඒ සෙනසුරු වටේට තියෙන ඒ ලස්සන වළලු මොනවද"?



ඈතට වළල්ලක් වගේ පෙනුනට පුතේ අයිස් කුට්ටි , කුඩා ගල් කැබලි, දූහුවිලි වගේ දේවල් වලින් තමයි ඔය වළලු පද්ධතිය හැදිලා තියෙන්නේ . අපේ හඳ මාමා ගේ යහළුවන් 62 ක් එහෙ ඉන්නවා.


අනේ හඳ මාමේ දැන්නම් මට ගොඩක් මහන්සියි, සීතල දරගන්නත් බැහැ මේ හරිය හොඳටම කළුවරයි මට ගෙදර යන්න ඕන. ඉන්නකෝ පුතේ බය නැතිව අපේ ඉර මාමාට තවත් දරුවන් දෙන්නෙක් ඉන්නවා මම එයාලවත් ටිකක් ළඟට ගිහින් පෙන්වන්නම් දැන් ගොඩාක්ම ළඟයි අර අඳුරේ විශාලාවට පෙනෙන නිල් පාට ග්‍රහ ලෝකය තමයි යුරේනස් කියන්නේ

හරි හරි මට තේරෙනවා මාමේ, එයත් ගොඩක් විශාලයි නේද? අර අර එයාටත් සෙනසුරුට වගේම ලස්සන වළල්ලක් තියෙනවා ඔව් පුතේ මෙයා තමයි තුන්වෙනියට විශාලතම ග්‍රහයා හැබැයි මෙයා ඉර මාමාට ගොඩක් ඈතින් ඉන්න නිසා ඉර මාමා වටායන්න ඔයාලගේ වගේ අවුරුදු 83 කටත් වැඩිය ගතවෙනවා.

දැන්නම් පුතේ මටත් හරිම මහන්සියි ඔයාව ආපහු ගෙදර අරලවන්නත් තියෙනවනේ අර ගොඩක් අන්ධකාරයේ ඈතින්ම පෙනෙන ග්‍රහ ලෝකය තමයි නෙප්චූන් කියන්නේ මෙයාගේනම් ළඟටවත් යන්න අමාරුයි ඒ තරම්ම එයා ළඟ සීතලයි.

අනේ මාමේ මේ හැමදෙයක්ම මගේ ඇස් දෙකෙන්ම දැකබලාගන්න සැලස්සුවාට හඳ මාමාට ගොඩක් ස්තූතියි. එතකොට හඳ මාමේ ඉර මාමාගේ බලය කවදාහරි නැතිවෙයිද? අපේ සීයා අපිව දාල ගියා වගේ ඉර මාමත් කවදාහරි මෙයාලව තනිකරලා යන්න යයිද ? ඔයා හරි පුතේ කවදාහරි දවසක ඉර මාමාගේ බලයත් නැතිව යාවි . එයාට එයාගේ දරුවෝ ටික තුරුලුකරගෙන ඉන්න බැරිතරම් වයසට ගිහින් දුර්වල වේවි එහෙම උනොත් එයා වටේයන මේ සියලුම දේවල් ඈතට විසිවෙලා යාවි , හැබැයි එහෙම දෙයක් වෙන්න තව ගොඩාක් කල් යනවා තාම ඉර මාමා ඉන්නේ හොඳට ශක්තිය තියන තරුණ කාලේ .

ඔන්න පුතේ ඔයා හඳ මාමාගෙන් ඉල්ලූ හැමදෙයක්ම මම අද පෙන්නුවා දැන් අපි පරිස්සමින් ඔයාලගේ මහ පොළවට යමු. මගේ පුතා දකින්න ඇතිනේ මේ සෞරග්‍රහ මණ්ඩලයේ ජීවින් ඉන්න එකම ග්‍රහයා තමයි ඔයාලගේ  මහ පොළව. ඒක  අපි හැමෝගෙම සම්පත ඔයාල ගොඩාක් ආදරෙන් එයාව රැකබලාගන්න ඕන. ඒ දේ ඔයාගේ යාලුවෝ හැමෝටමත් කියලා දෙන්න.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විෂවත කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසහ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ ශුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්